**සීමාසහිත සතොස ආරක්ෂක සහ පොදු (පුද්ගලික) සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව**
**2023 / 2024**

---

සීමාසහිත සතොස ආරක්ෂක සහ පොදු (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2023 සහ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂවල මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2022/2023 සහ 2023/2024 වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් , වගකීම්, ආදායම් හා වියදම්**

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 26,373,934 |
| ජංගම වත්කම් | 92,777,289 |
| | ------------- |

| | |
|---|---|
| මුළු වත්කම් | **119,151,223** |
| | ========== |
| **ස්කන්ධය හා වගකීම්** | |
| ස්කන්ධය | 45,202,102 |
| වගකීම් | |
| ජංගම නොවන වගකීම් | 16,899,627 |
| ජංගම වගකීම් | 57,049,494 |
| | -------------- |
| මුළු වගකීම් | **73,949,121** |
| මුළු ස්කන්ධය හා වගකීම් | **119,151,223** |
| | ========= |
| මුළු ආදායම | 249,765,956 |
| මුළු වියදම | (255,037,172) |
| | --------------- |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **(5,271,216)** |
| | ========= |

**2.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යවසායන්ගේ සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 2.3 වගන්තිය | 2022/2023 සහ 2023/2024 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සකස් කර නොතිබුණි. | එකඟයි. අප විසින් ඉදිරි වර්ෂ සඳහා පිළියෙල කර තිබේ. | මාර්ගෝපදේශ අනුව ක්‍රියාකාරී සැලසුම් සහ අයවැය සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 4.4 වගන්තිය | සමාගම අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | අප නුදුරු අනාගතයේ දී අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරන්නෙමු. | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොත | | | |
| (i) 3.1 සහ 3.2 වගන්ති | සමාගම සඳහා කාර්ය මණ්ඩලය සහ බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අනුමත කර නොතිබුණි. | අප විසින් කාර්ය මණ්ඩලය සකස් කර තිබේ. සතොස වෙතින් තවමත් අනුමැතිය ලැබී නැත. | කාර්ය මණ්ඩලය සහ බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 6.7 වගන්තිය | ස්ථාවර වත්කම් සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කර නොතිබුණි. | සටහන් කර ගනිමි. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව වත්කම් සත්‍යාපනය සිදු කළ යුතුය. |
| (iii) 7.5 වගන්තිය | මාසික, කාර්තුමය සහ වාර්ෂික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබුණි. | සටහන් කර ගනිමි. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගම විසින් ආරක්ෂක සේවා සැපයූ ස්ථානයක් වන ජා-ඇල සතොස මෙගා ස්ටෝර් හි 2022 වර්ෂයේදී රු.4,852,622ක මුදල් සොරකමක් සිදුවී තිබුණි. විමර්ශනයක් පැවැත්වීමෙන් තොරව, එහි වගකිම සමාගම වෙත පවරා තිබු අතර හානි අයකර ගැනීම | එය ක්‍රියාවලියේ පවතී. | හිලව් කළ මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි. සොරකම් කළ මුදලින් රු. මිලියන 2.4ක් ලංකා සතොස සමාගම විසින් ආරක්ෂක ගාස්තු වලින් හිලව් කර තිබුණි. | | |
| (ආ) මුළු දිවයිනම ආවරණය වන පරිදි සමාගම විසින් කලාපීය කළමනාකරුවන් 12 දෙනෙකු පත් කර තිබූ අතර ඔවුන්ගේ පත්වීම්, කාර්යසාධනය සහ පැමිණීම සමාලෝචනය කිරීම සඳහා නිසි ක්‍රියා පටිපාටි හඳුන්වා දී නොතිබුණි. | 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අපි අභ්‍යන්තර පාලනයන් කිහිපයක් සකස් කර ඇත්තෙමු. | නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සමාගම, සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා ඇති අතර 2024 වර්ෂය සඳහා ගොඩනැගිල්ල වෙනුවෙන් කුලී ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | අපට සතොස පාර්ශවයෙන් කුලී ගිවිසුම ලැබී නොමැත. | ගොඩනැගිල්ල සඳහා කුලී ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 ඡේදයට අනුව, සමාගම විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ලැයිස්තුගත කළ යුතු අතර මාස හයකට නොවැඩි කාලයක් තුළ ක්‍රමානුකූලව යාවත්කාලීන කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි කරුණු ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්මක් 2022/2023 හා 2023/2024 වර්ෂ සඳහා සකස් කර නොතිබුණි. | සටහන් කරගත් අතර අනාගතයේදී අවශ්‍ය කටයුතු සිදු කෙරේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2024 මාර්තු 31 දිනට සමාගමේ තථ්‍ය සේවක සංඛ්‍යාව 33 ක් වූ අතර, එහි අනියම් පදනම මත පත්වීම් 05 ක් තිබුණි. | සටහන් කර ගනිමි. මෙයට හේතුව අපගේ සමාගමට අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති වීමයි. | කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී ඇත්තේ එම සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය, සමාජ සංවර්ධනය සහ පාරිසරික ආරක්ෂණ සැලැස්ම මත පදනම්ව වුවද, සමාගම එයට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක සහ දර්ශක හඳුනාගෙන නොතිබූ අතර නිවැරදි දත්ත සඳහා ප්‍රවේශ වී නොතිබුණි. භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමද 2023 වන විට හඳුනාගෙන නොතිබුණි. | සටහන් කර ගනිමි. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව අරමුණු, ඉලක්ක සහ දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |